# හත්ථිගාමක උග්ග සූත්‍රය

(අ.නි., 5, 106 පිට)

භාග්‍යවතුන් වහන්සේ එක් සමයෙක වජ්ජි ජනපදයෙහි හත්ථිගමෙහි වාසය කරන අවස්ථාවක එගම වැසි උග්ග ගෘහපති පිළිබඳව කරන ලද පැහැදිලි කිරීමක් මෙම සූත්‍රයෙන් විස්තර වේ. ගෘහස්ථ ජීවිතයක් ගෙවමින් සිටි උග්ග ගෘහපති තෙමේ බුදුරදුන් මුණ ගැසීමෙන් පසුව ඇති වූ ආධ්‍යාත්මික හා බාහිර වෙනස මෙම සූත්‍රයෙන් විශේෂයෙන් විස්තර වේ.

දිනක් බුදුපියාණන් වහන්සේ භික්ෂූන් අමතා '**මහණෙනි, හත්ථිගම්වැසි උග්ග ගෘහපති තෙමේ ආශ්චර්ය අද්භූත අංග අටකින් සමන්විත බව දරා ගන්න යැ**' යි දේශනා කළහ.

*අට්ඨහි භික්ඛවෙ, අච්ඡරියෙහි අබ්භුතෙහි ධම්මෙහි සමන්නාගතං උග්ගං ගහපතිං හත්ථිගාමකං ධාරෙථා'ති.*

බුදුරජාණන් වහන්සේ මෙලෙස උග්ග ගෘහපති තුළ පවත්නා සුවිශේෂී ලක්ෂණ සංඛ්‍යාව සඳහන් කළ ද ඒවා කුමක් ද යන්න පැහැදිලි නොකළහ. එබැවින් බුදුරදුන්ගේ මෙම ප්‍රකාශයෙන් පසු එක්තරා භික්ෂුවක් පෙරවරුවෙහි හැඳ පෙරවා පාසිවුරු ගෙන උග්ග ගෘහපතිතුමාගේ නිවසට වැඩම කොට පැනවූ අසුනෙහි වැඩ හුන්හ. එවිට උග්ග ගෘහපතිතුමා එම භික්ෂූන් වහන්සේට වැඳ එකත් පසෙක හිඳ ගත්තේය. මෙහි දී එම භික්ෂූන් වහන්සේ බුදුරදුන් ඔහු පිළිබඳ කළ ප්‍රකාශය සඳහන් කොට එම ආශ්චර්ය අද්භූත කරුණු මොනවාදැයි විමසා සිටියහ.

මෙහි දී උග්ග ගෘහපතිතුමා සඳහන් කළේ තමා පිළිබඳව බුදුරදුන් කුමන කරුණු අටක් පිළිබඳව සඳහන් කළාදැයි නොදන්නා බවයි. එහෙත් තමා පිළිබඳව සිහිකිරීමේ දී තමාට සිහිකළ හැකි කරුණු අටක් තිබෙන බව ද සඳහන් කළේ ය. එවිට ගෘහපතිතුමා එම කරුණු අට එම භික්ෂූන් වහන්සේට එකිනෙක පැහැදිලි කළේ ය.

1. භාග්‍යවතුන් වහන්සේ නාගවනයෙහි දී මුල් වරට තමාට මුණ ගැසුණේ සපිරිවරින් ඉඳුරන් පිනවමින් සිටින අවස්ථාවකදී බවත් **බුදුරදුන් දුටු සැණින් තමා ප්‍රසාදයට පත් ව සුරා මතය සිඳුණ බවත්** ය. මෙය තමා තුළ පවත්නා පළමු ආශ්චර්ය අද්භූත කරුණ බවයි.

2. මෙලෙස බුදුරදුන් මුණ ගැසුණ මුල් අවස්ථාවෙහි දී උන්වහන්සේ කෙරෙහි ප්‍රසාද උපදවා ධර්ම දේශනයට සවන් දීමේ දී හේතුඵල දහම අවබෝධ වී බ්‍රහ්මචරිය පස්වැනි කොට ඇති සීලය සමාදන් වූ බව. මෙහිදී බුදුරජාණන් වහන්සේ ඔහුට පළමුව දානකථා, සීලකථාදී ආනුපුබ්බීකථාව දේශනා කොට ඉන්පසු දුක්ඛාදී චතුරාර්ය සත්‍ය මිශ්‍රිත සාමුක්කංසික දේශනාව සිදු කළහ. එකල්හි *යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරෝධධම්මං* යන පටිච්චසමුප්පාද දේශනාව ඇසීමෙන් ඔහු ධර්මාවබෝධයට පත් විය. මෙලෙස **බුදුරදුන් හමු වූ මුල් අවස්ථාවේදී ම ප්‍රසාදයට පත් ව ධර්ම ශ්‍රවණය කොට ගිහියකු වශයෙන් බඹසර දිවියට පිවිසීම** සුවිශේෂී කරුණකි. මෙය උග්ග ගෘහපතිතුමා තුළ පැවැති දෙවන ආශ්චර්ය අද්භූත කරුණයි.

3. ගෘහපතිතුමාට භාර්යාවන් සිව් දෙනකු සිටි අතර ඔහු බ්‍රහ්මචරිය ශික්ෂාපදය පස්වැනි කොට ඇති සීලය සමාදන් වීමෙන් පසු තමා බිරින්දෑවරුන් වෙත ගොස් මෙලෙස ප්‍රකාශ කළහ. නැගණිවරුනි, මම දැන් බ්‍රහ්මචරිය ශික්ෂාපදය පස්වැනි කොට ඇති සීලය රකිමි. එබැවින් යමෙක් කැමැති නම් මෙහි ම සිටිමින් භෝග සම්පත් පරිහරණය කරමින් පින්දහම් කරමින් වාසය කරන්න. කැමැති නම් තම මව්පියන් වෙත නැවත යන්න. වෙනත් පුරුෂයකු පිළිබඳ අදහසක් ඇත් නම් පවසන්න, මම ඔහුට ඔබ පවරා දෙමි. මෙසේ පැවැසූ කල්හි එක් බිරිඳක් කිසියම් පුරුෂයකුට කැමැති බව පළ කළාය. එහි දී උග්ග ගෘහපතිතුමා එම පුරුෂයා ගෙන්වා එක් අතකින් තම බිරිඳගේ අත අල්වා අනික් අතින් පැන් කෙණ්ඩිය ගෙන අත පැන් වත් කොට තම බිරිඳ එම පුරුෂයාට සරණ පාවා දුනි. මෙහි දී ඇති ආශ්චර්ය අද්භූත සුවිශේෂී කරුණ නම් මෙලෙස **තම තරුණ බිරිඳ වෙනත් පුරුෂයකුට පවරා දීමේ දී ඔහුගේ සිතෙහි කිසිදු වෙනසක් ඇති නොවුණ බවයි**. මෙය ඔහු තුළ පැවැති තෙවන ආශ්චර්ය අද්භූත කරුණයි.

4. උග්ග ගෘහපතිතුමාගේ කුලයෙහි මහත් ධනය තිබුණු බවත් එම ධනය කලණදහම් ඇති සිල්වතුන් හා මෙතෙක් දිය යුතු ය, මෙතෙක් නොදිය යුතු ය වශයෙන් වෙන් නොකරන ලද බව. එනම් **සිල්වතුන් වෙත ඕනෑම දෙයක් ඕනෑම අවස්ථාවක දීමට සූදනමින් සිටි බවයි.** මෙය ඔහු තුළ පැවැති සිව්වන ආශ්චර්ය අද්භූත කරුණයි.

5. තවද මොහු **භික්ෂූන් ඇසුරු කිරීමේ දී ගරුසරු සහිතව මැනැවින් ඇසුරු කරන අතර භික්ෂූන් වෙතින් ධර්මය ම අසන බව. භික්ෂූන් තමාට ධර්මය නොදෙසන්නේ නම් තමා දන්නා ධර්ම කරුණු භික්ෂූන් වහන්සේට පවසන බව.** මෙය ගෘහපතිතුමා තුළ පැවැති පස්වැනි ආශ්චර්ය අද්භූත කරුණයි.

6. උග්ග ගෘහපතිතුමා භික්ෂූන්ට දනයට ආරාධනා කළ කල්හි ඊට කලින් දෙවිවරුන් පැමිණ දනයට වඩින භික්ෂූන්ගේ ආධ්‍යාත්මික ගුණාංග පිළිබඳව දැනුම් දෙති. ඒ අනුව අසවල් භික්ෂුව උභතොභාගවිමුත්ත ය, අසවල් භික්ෂුව පඤ්ඤාවිමුත්ත ය, අසවල් භික්ෂුව කායසක්ඛී ය, අසවල් භික්ෂුව දිට්ඨිප්පත්ත ය, අසවල් භික්ෂුව සද්ධානුසාරී ය, අසවල් භික්ෂුව ධම්මානුසාරී ය, අසවල් භික්ෂුව කලණ දහම් ඇති සිල්වතෙකි, අසවල් භික්ෂුව පාපදහම් ඇති දුසිල්වතෙකි. මෙලෙස **තම නිවසෙහි දනයට වඩනා භික්ෂූන්ගේ ප්‍රඥ ශීලාදි ගුණයන් මැනැවින් දැන සිටියද ද දනය බෙදන විට අසවල් භික්ෂුවට මඳක් දෙමි, අසවල් භික්ෂුවට බොහෝ කොට දෙමි වශයෙන් නොසිතෙන බව.** මෙය මොහු තුළ පැවැති හයවැනි ආශ්චර්ය අද්භූත කරුණයි.

7. ගෘහපතිතුමා වෙත දෙවියන් පැමිණ 'භාග්‍යවතුන් වහන්සේ විසින් දේශිත ධර්මය ස්වාක්ඛාත යැයි' පවසති. මෙසේ පවසන කල්හි 'ඔබ එසේ නොපැවසුව ද භාග්‍යවතුන් වහන්සේ විසින් දේශිත ධර්මය ස්වාක්ඛාත ම ය' යනුවෙන් උග්ග ගෘහපතිතුමා පවසයි. මෙලෙස **දෙවියන් පැමිණ ඔහු සමඟ සාකච්ඡා කිරීමේ දී දෙවියන් තමා වෙත පැමිණීම පිළිබඳව හෝ තමා සමඟ කතා කිරීම පිළිබඳව හෝ සිතෙහි කිසිදු නැඟීමක් උඩඟු බවක් හට නොගන්නා බව.** මෙය ඔහු තුළ පවත්තනා සත්වැනි ආශ්චර්ය අද්භූත කරුණකි.

8. තව ද භාග්‍යවතුන් වහන්සේට පෙර උග්ග ගෘහපතිතුමා කලුරිය කරන්නේ නම් එහි දී බුදුරජාණන් වහන්සේ ඔහු පිළිබඳව ප්‍රකාශයක් සිදු කරනු ඇත. එනම් **හත්ථිගාම උග්ග නැවත කාම ලෝකයට නොපැමිණෙන බවයි.** මෙලෙස මරණින් පසු තමා නැවත කාමලෝකයට නොඑන බව ද ආශ්චර්ය අද්භූත කරුණක් වශයෙන් දක්වා තිබේ. මෙය අටවැනි සුවිශේෂී ලක්ෂණයයි.

මෙම කරුණු මෙලෙස ඉදිරිපත් කළ උග්ග ගෘහපතිතුමා එම භික්ෂූන් වහන්සේට සඳහන් කළේ තමා තුළ මෙම ආශ්චර්ය අද්භූත කරුණු පවත්නා අතර බුදුරදුන් කුමන කරුණු අදහස් කළේ ද යන්න තමා නොදන්නා බවයි.

ඉන්පසු ගෘහපතිතුමාගේ නිවසින් ලැබුණ දනය ද වළඳ නැවත විහාරස්ථානයට වැඩම කළ එම භික්ෂූන් වහන්සේ පස්වරුවෙහි බුදුරදුන් මුණ ගැසීමට ගියහ. එහිදී භාග්‍යවතුන් වහන්සේට වැඳ නමස්කාර කොට උග්ග ගෘහපතිතුමා සමඟ පැවැති සංවාදය බුදුරදුන්ට විස්තර කළහ. එවිට බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කළේ ගෘහපතිතුමා සඳහන් කළ කරුණු ඔහු තුළ එලෙස ආශ්චර්ය අද්භූත කරුණු වශයෙන් පවත්නා බවයි. එනම් තමන් වහන්සේ අදහස් කළේ ද එම ගුණාංග බවයි.

ඉහත දක්වූ කරුණුවලින් ආර්ය ශ්‍රාවකයකු තුළ පවත්නා සුවිශේෂී ගුණාංග හඳුනා ගැනීමට අවස්ථාව සැලසේ. මත්පැන් භාවිත කොට මත් ව උද්‍යානයක විනෝද වෙමින් සිටි උග්ග ගෘහපති බුදුරදුන් දුටු සැණින් ප්‍රසාදය උපදවා ගැනීම ඔහුගේ සසර පුණ්‍යමහිමය පෙන්නුම් කෙරෙන ලක්ෂණයකි. එම අවස්ථාවෙහි දී ම ධර්මශ්‍රවණය කොට *යං කිඤ්චිසමුදය ධම්මං සබ්බං තං නිරෝධධම්මං* යන බුදුදහමේ

සාරය තේරුම් ගැනීමට ද ඔහුට අවස්ථාව සැලසිණි. මෙහි දී පැවැති විශේෂත්වය නම් ඔහු බ්‍රහ්මචරිය ශික්ෂාදය සහිත සීලය සමාදන් වීමයි.

ධර්ම දේශනයට සවන් දුන් මුල් අවස්ථාවෙහි සිට බඹසර දිවියට පිවිසි උග්ග ගෘහපති තම භාර්යාවන් පිළිබඳව කටයුතු කළ ආකාරය ඉතා වැදගත් වේ. එහි දී ඔවුන්ගේ නිදහසට බාධා නොවන ලෙසත් ලෝක ව්‍යවහාරයට අවනතවත් මානව දයාවෙන් යුතුවත් ඔහු ක්‍රියා කරන ආකාරය බුදුදහමේ ප්‍රතිපදාව කෙතරම් ප්‍රායෝගික ද යන්න විදහා දක්වෙන කදිම නිදසුනකි. තවද සිල්වත් උතුමන් වෙත කලින් වෙන් නොකොට (නොබෙදා) දන් දෙන ආකාරය විමසිය යුත්තකි. අනාගාමී ශ්‍රාවකයකු වශයෙන් ඕනෑම දෙයක් ඕනෑම අවස්ථාවක තෙරුවන වෙත කැප කිරීමට සූදානමින් සිටි අයුරු මෙමගින් පෙන්නුම් කෙරේ.

සංඝයා ඇසුරු කිරීමේ දී මැනැවින් සකසා ගරුසරු ඇති උන් වහන්සේලා ඇසුරු කිරීමත් මෙලෙස මුණගැසුණ විට ධර්ම සාකච්ඡාවෙහි ම නිරත වන ආකාරයත් සැබෑ ශ්‍රාවකයකුගේ චරිතාංග පෙන්නුම් කෙරෙන ලක්ෂණයකි. ඒ අතර සංඝ රත්නයට පුදපූජා පැවැත්වීමේ දී පුද්ගලික ගුණාංග නොව සමස්ත සංඝයාගේ ගුණය සලකා සමසිතින් දානය පූජා කිරීම ද විශේෂ ලක්ෂණයකි. මෙහි දී සඟසතු දානයකදී පිළිපැදිය යුතු ආකාරයත් ශාසන චිරස්ථිතිය මෙන් ම කලේශ දුරලීම ද ඉලක්ක කොට එය සිදු කළ යුතු ආකාරය මෙමගින් පෙන්නුම් කෙරේ.

දෙවියන් පැමිණ සද්ධර්මය ගැන කරන ප්‍රකාශයේ දී දෙවියන්ගේ වචනයටත් වඩා තමා අද්දැකීමෙන් දන්නා ධර්මය පිළිබඳ තමා තුළ පවත්නා විශ්වසනීයත්වය මෙහි දී විදහා දක්වේ. එමෙන් ම දෙවියන් තමා සමඟ කතාබහ කළ ද තෙරුවන අබියස ඊට වඩා උසස් දෙයක් තමාට නොමැති බැවින් එම දෙවියන් හා කතාකිරීමේ දී තමාගේ සිතෙහි උඩඟු බවක් ඇති නොවන බව මොහු අවධාරණය කරයි. බුදුරදුන්ට පමණක් නොව සැරියුත් මාහිමි ආදි ශ්‍රාවකයන්ට පවා දෙවියන් බ්‍රහ්මයන් මහත් ගරු සැලකිලි දක්වා තිබෙන මෙම සසුනෙහි දෙවියන් කතාබහ කළ පමණින් උද්දාමයට පත්වීමට අවශ්‍යතාවක් නොමැත. ලොව ඕනෑම විද්වතකු, බලවතකු, ප්‍රසිද්ධ තැනැත්තකු මතු නොව දෙවියකු, බ්‍රහමයකු වුව ද මේ බුදුසසුනට පිවිසීම හෝ බුදුසසුන ඇගයීම හෝ විශේෂ තත්ත්වයක් නොවේ. එහි පවත්නා විශේෂත්වය නම් ශ්‍රාවකයන් තම නුවණින් ම මෙම දහම ප්‍රත්‍යක්ෂ කිරීමෙන් ඇතිවන ජීවිතාවබෝධය හා ලෝකාවබෝධයයි.

අවසන් කරුණින් දක්වෙන්නේ උග්ග ගෘහපතිතුමා ලබා තිබූ ආධ්‍යාත්මික තත්ත්වයේ ස්වභාවයයි. ඔහු නැවත කාමලෝකයට නොඑන බව දක්වීමෙන් ප්‍රකාශ වන්නේ අනාගාමී තත්ත්වයට පත් ව සිටි ආකාරයයි. මගඵලලාභී උතුමන් තමන් ලද ආධ්‍යාත්මික දියුණුව තෘෂ්ණා, දෘෂ්ටි, මානයන්ගෙන් තොරව ප්‍රකාශ කරන ඇයුරු පිළිබඳ මෙය කදිම නිදසුනකි.

සූත්‍රයේ සමස්ත විග්‍රහයෙන් විදහා දක්වෙන්නේ උසස් ආධ්‍යාත්මික තත්ත්වයක සිටින ශ්‍රැතවත් ශ්‍රාවකයකු ක්‍රියා කරන ආකාරයයි. හුදෙක් ආධ්‍යාත්මික ජීවිතය පමණක් නොව තම ගෘහස්ථ සහ සාමාජීය ජීවිතයට ද සාර්ථකව බුද්ධිමත් ම මුහුණ දෙන අයුරු මෙමගින් පෙන්නුම් කෙරේ. එහි දී තෙරුවන ප්‍රමුඛත්වයෙහි ලා කටයුතු කරන ආකාරයත් අන් අයගේ නිදහසට හා ගෞරවයට හානියක් නොවන අයුරින් ක්‍රියා කිරීමත් විශේෂයෙන් කැපී පෙනෙයි.

ඔබ සැමට තෙරුවන් සරණයි !

එක්සත් ජනපදයේ කොවීනාහි ලොස් ඇන්ජලිස් බෞද්ධ විහාරස්ථානයේ

**දසදින සූත්‍රධර්ම විවරණ වැඩසටහන 06 වන දේශනය**

(2020 දෙසැම්බර මස 14 වන සඳුද) (UD)

# *Hatthigāmaka Ugga Sutta*

(Tranaslated by Bhikkhu Sujato)

At one time the Buddha was staying in the land of the Vajjis at the village of Hatthi. There the Buddha addressed the mendicants: “Mendicants, you should remember the householder Ugga of Hatthi as someone who has eight amazing and incredible qualities.”

That is what the Buddha said. When he had spoken, the Holy One got up from his seat and entered his dwelling.

Then a certain mendicant robed up in the morning and, taking his bowl and robe, went to the home of the householder Ugga of Hatthi, where he sat on the seat spread out. Then Ugga of Hatthi went up to that mendicant, bowed, and sat down to one side. The mendicant said to him:

“Householder, the Buddha declared that you have eight amazing and incredible qualities. What are the eight qualities that he spoke of?”

“Sir, I don’t know what eight amazing and incredible qualities the Buddha was referring to. But these eight amazing and incredible qualities are found in me. Listen and pay close attention, I will speak.”

“Yes, householder,” replied the mendicant. Ugga of Hatthi said this:

“Sir, when I first saw the Buddha off in the distance I was partying in the Dragon’s Park. My heart was inspired as soon as I saw him, and I sobered up. This is the first incredible and amazing quality found in me.

With confident heart I paid homage to the Buddha. The Buddha taught me step by step, with a talk on giving, ethical conduct, and heaven. He explained the drawbacks of sensual pleasures, so sordid and corrupt, and the benefit of renunciation. And when he knew that my mind was ready, pliable, rid of hindrances, joyful, and confident he explained the special teaching of the Buddhas: suffering, its origin, its cessation, and the path. Just as a clean cloth rid of stains would properly absorb dye, in that very seat the stainless, immaculate vision of the Dhamma arose in me: ‘Everything that has a beginning has an end.’ I saw, attained, understood, and fathomed the Dhamma. I went beyond doubt, got rid of indecision, and became self-assured and independent of others regarding the Teacher’s instructions. Right there I went for refuge to the Buddha, his teaching, and the Saṅgha. And I undertook the five training rules with celibacy as the fifth. This is the second incredible and amazing quality found in me.

I had four teenage wives. And I went to them and said: ‘Sisters, I’ve undertaken the five training rules with celibacy as fifth. If you wish, you may stay here, enjoy my wealth, and do good deeds. Or you can return to your own families. Or would you prefer if I gave you to another man?’ When I said this, my eldest wife said to me: ‘My lord, please give me to such-and-such a man.’

Then I summoned that man. Taking my wife with my left hand and a ceremonial vase with my right, I presented her to that man with the pouring of water. But I can't recall getting upset while giving away my teenage wife. This is the third incredible and amazing quality found in me.

And though my family has wealth, it's shared without reserve with ethical people of good character. This is the fourth incredible and amazing quality found in me.

When I pay homage to a mendicant, I do so carefully, not carelessly. If that venerable teaches me the Dhamma, I listen carefully, not carelessly. But if they don't teach me the Dhamma, I teach them. This is the fifth incredible and amazing quality found in me.

It's not unusual for deities to come to me when the Saṅgha has been invited and announce: 'Householder, that mendicant is freed both ways. That one is freed by wisdom. That one is a personal witness. That one is attained to view. That one is freed by faith. That one is a follower of the teachings. That one is a follower by faith. That one is ethical, of good character. That one is unethical, of bad character.' But while I'm serving the Saṅgha I don't recall thinking: 'Let me give this one just a little, and that one a lot.' Rather, I give impartially. This is the sixth incredible and amazing quality found in me.

It's not unusual for deities to come to me and announce: 'Householder, the Buddha's teaching is well explained!' When they say this, I say to them: 'The Buddha's teaching is well explained, regardless of whether or not you deities say so!' But I don't recall getting too excited by the fact that the deities come to me, and I have a conversation with them. This is the seventh incredible and amazing quality found in me.

If I pass away before the Buddha, it wouldn't be surprising if the Buddha declares of me: 'The householder Ugga of Hatthi is bound by no fetter that might return him to this world.' This is the eighth incredible and amazing quality found in me.

These eight amazing and incredible qualities are found in me. But I don't know what eight amazing and incredible qualities the Buddha was referring to."

Then that mendicant, after taking alms-food in Ugga of Hatthi's home, got up from his seat and left. Then after the meal, on his return from alms-round, he went to the Buddha, bowed, and sat down to one side. He informed the Buddha of all he had discussed with the householder Ugga of the village of Hatthi. The Buddha said:

"Good, good, mendicant! When I declared that the householder Ugga of the village of Hatthi was someone who has eight amazing and incredible qualities, I was referring to the same eight qualities that he rightly explained to you. You should remember the householder Ugga of Hatthi as someone who has these eight amazing and incredible qualities."